# 20

විමල් යළිත් ගාලසිරි හෝටලයට ඇවිත් සිටියේය. වැස්ස තුරල් වූවද, රාත්‍රිය ලං වූ බැවින්ද, වලාකුල් ගැවසී වූ බැවින්ද අවට අඳුරු විය. හෝටලය තුළ සුදු නල විදුලි බුබුළු දැල්විණි.

මේසය අසල හිඳ සිටියේ තේ බොන්නට ආ දෙතුන් දෙනෙකු පමණි. තවම රෑ කෑම වේලාව නොවීය. ඉදිරි කවුන්ටරය වෙත හිඳ සිටි තට්ටයා, විමල් ඇතුල්වෙත්ම යන්තමට හිස ඔසවා බලා යළිත් තමාගේ පත්තරයට හිස ඔබා ගත්තේය.

තේ බොමින් සිටි දෙතුන් දෙනාද නිහඬය. මිනිසුන් කෙතරම් අක්‍රීයද, කෙතරම් උදාසීන දැයි විමල්ට සිතුණි. මිනිස්සු ඔහේ ඉන්නවාට ඉන්නවා - ඔහේ ජීවත්වෙනවා, යැයි විමල්ට සිතුණේ ඒ පරිසරයේය. මොන තේරුමක් - අරුතක් ඇද්ද?

විමල් අභ්‍යන්තරයට - මුළුතැන්ගෙයිනට යන දොර පෙනෙන මානයේ ඒ අතට මුහුණ ලා හිඳ ගත්තේය. කොයි මොහොතේ හෝ ආනන්ද තරුණයා - උදයසිරි හෝ වෙන කෙනෙකු - එළියට ඒවි නොවැ - ඔහු සිතුවේය. උදයසිරි නම් වඩාත් හොඳයි.

එහෙත් පිටතට ආවේ සෝමෙය. විමල්ව දැක්කොත් සෝමෙ මදක් කැළඹුණාක් මෙනි. එහෙත් ඒ බව නොපෙන්වා සෝමෙ විමල් වෙතට ආවේය.

"ස-ර්- තේ- බොනවද?" සෝමෙ පසෙක සිට ඇසුවේ බයාදු ආකාරයෙනි.

"මා-ව මතකද?" විමල් ඇසුවේ තමා ආ කාරණයටම බසින්නට සිතාගෙනය.

"ඔව් සර්- දවල් - ආවනෙ?" සෝමෙ කීවේය- "අපි කතාත් කළානෙ."

"මොකද්ද නම කිව්වෙ?"

"මං සෝම තිලක- මට - සෝමෙ කියන්න සර්."

"සෝමෙ- කෝ අපේ උදය සිරි?"

"ඒක තමයි සර්- උදයසිරි දවල් කෑමෙන් පස්සෙ-

ගියා. ගියාමයි. ආවෙ නෑ සර්."

"මො - නවා ?"

"ඔව් සර්."

බිමල් ඉබේම නැගිට්ටේය. සිය දෑත් ක්‍රියා කළේ යන්ත්‍රානුසාරයෙනි. හැඟීම් සියල්ල මැරුණාක් මෙනි. තමා බලාපොරොත්තු තබා ගෙන ආවේ උදයසිරි මුණගැසී අර ලියුම ගැන යමක් තේරුම් ගන්න අටියෙනි. තමා උදයසිරිට බය කොටද? උදයසිරි වෙත යම් කිසි දොසක් ඇති. නැත්නම් මිනිහා පලා යන්න හේතුවක් නැහැනෙ.. දැන් මෙතන ඊළඟ මොන මඟුලක් කරන්නද?

"සර් - තේකක් - බොනවද?"

"නෑ - එපා." කී බිමල් තම මල්ලත් ගෙන දොරටුවෙන් පිටවූයේය.

කාර්යාලයේ කට්ටිය යන්තමටවත් හිස ඔසවා බැලුවේ නැත.

දොරෙන් පිටතට ආ බිමල්ට වම්පසට වෙන්නට, සෙවන දෙන බස් නැවතුම් පළක් පෙනුණි. මඩ කාඩිත් උඩින් පනිමින් සිය අඩියට දෙකට එතැනට සේන්දු විය.

අවට අඳුරු විය. පාරේ එහා අන්තේ කඩ පේළියක නාවින්සු එළි දැල්වෙයි. පහන් කණුවල ඇති මන්දා ලෝකයට ලෝකය එළිය කළ නොහැක.

තවා කුමක් කරන්නද? බිමල් සිතුවේය. උදයසිරිගෙන් ඒ මොහොතේම ප්‍රශ්න කළා නම් ඉවරයි. තමා එතනටම ඇසුවා කරල්ලා චිටින් හැරියා නොවේද? උදයසිරි කියන මිනිහා කොහේ යන්න ඇත්ද? කොහේ ගියත් - අද හෝ දහයමාරට මිනිහා මෙතැනට එයිද? තමා ඇසූ ප්‍රශ්නයට මිනිහා බය වෙන්න ඇති. අර ලියුමේ යථාර්ථය මොකද්ද?

පිටුපසින් අඩි හඬක් ඇසුණි. නාගසිරි කාර්යාලයේ පසු දොරකින්, බිමල් වෙතට ඇවිද ආවේ සෙමෙය.

"සර් - මම -"

"ඇයි ?"

"අර ලියුම ගැන නේද සර් ? උදයසිරි ගැන කියන්න - සර්."

"ඉතින් ?"

"මෙතන බෑ සර්. දැන් වෙලා නෑ සර්."

"තමුසෙ මොනවද දන්නෙ?"

"මං යමක් - දන්නව සර්.. තේරුම් කරන්න වෙලා මදි සර්."

මේ මිනිහත් බොරුකාරයෙක් - විමල්ට සිතුණි.

"මට කවුරුවත් විශ්වාස නෑ සියි."

"සර් - මේ අහන්න. මං දැන් හෙට කූඩ උයන්න තියෙනවා. වැඩි වෙලා රඳන්න බෑ. මට සර්ගෙ නොම්මරයක් දෙන්න - මං කතා කරන්න."

සෝමෙගේ හදිසිය විමල්ටත් වැටහුණාක් මෙන් විමල් තම මල්ලේ දින පොතෙන් ඉරාගත් කොළ කැබැල්ලක, තම දුරකථනය ලියා සෝමෙ අතට දුන්නේය.

සෝමෙ එය කමිස සාක්කුවේ ලා ගනිමින් ආපසු හැරෙනවිටත්, හෝටලේ ව්‍යුත්පර වෙත පියතම නම් අනෙක් ආවතේව කරුවා බලා සිටියේය.

'ඉන් කාව විශ්වාස කරන්නද?' විමල්ට සිතුණි 'මං දැන් මගේ සෙල් ෆෝන් නොම්බරෙත් මූට දුන්නා - මූ මොන ප්ලෑනක් අඳියිද?'

පොලිසියට කිව්වොත් -- පොලිසියට කිව්වොත් තමා මොනවා කියා පැමිණිලි කරන්නද? තාත්තා තවම ගෙදර නොආ බව පොලිසියට කියන්නද? නෑ සිය කතරගම යනව, කිව්වනෙ. හොඳයි - තව දවසක් බලනවා - ඉන් පස්සෙ තමා, උඩ දැක්කි ජායාරූප හා ලිපිය පොලීසියට බාර දුන්නොත්.. අර ජායාරූප වල සැබවින්ම පෙනී සිටින්නේ තාත්තා නම්.. තාත්තාගේ ඒ ක්‍රියාවලිය - අම්ම දෙනම දැන ගත්තොත් - අම්ම දෙනාටම වඩා අම්මා දැන ගත්තොත් - අම්මාට මොනවා වෙයිද? නෑ තව දවසක් - දෙකක් - බලන්න ඕනෑ - තාත්තා ගෙදර එයි. මේ ලියුමේ අභිරහස හොයා ගන්න එකයි වැදගත් - තමා, ඒ ගැන සොයන්නේ නැතිව මේසා නම් ගැහැණියකට වෙච්ච අයාලේ ගියා නොවේද? තාත්තාත් තමා, මෙතෙක් එවන් ඉලාවකට යන්ව වල්මත් වී පසුපස නොදැක, කතරගම හොයා අතරමං උනාද?

නොයෙක් දෙබිඩි සිතුවිලි මැද, විමල් තමා ඉදිරියේ නැවතුණ බස් රියක නැගී යළිත් කළුතර බෝධිය අතට ගමන්

ගන්නේය.

මේසා, වෙසෙන අඩවිය පසු කරනම එතැනින් බැස ගන්නට ඇය මොහොතකට සිතුවිය. එහෙත් ඒ ඉසව්වට ගිහින් මොන එහෙකටද? අද තවම ඇගේ නවාතැනට ඇවිත් නැත. හිල්ඩා දුනුවිල පියානෝ වාදන උගන්වනවා ඇති. ඇල්ෆි ටෙරා මිච් විලාසයෙන් බලාගෙන ඇති.

මහා මඟීය මැද හන්දියේ ලොකු ඔරලෝසුවේ කටුවේ මූර්තාන වෙලාව හය පසුවී විනාඩි විස්සකි. සියල්ල නිරීක්ෂණය කරන කාලය සෙමින් ගමන් කරයි. ජීවිත සියල්ල කාලානුරූපීය. සියලු දෙනා ගමන් ගන්නේ යන්ත්‍රානුසාරයෙනි.

බස්රිය බෝධිය අසල නැවතුණි. එතැනින් බැස ගන්නට බිමල්ට සිතුණේ නැත. තව මදක් ඉදිරියට ගිය බස් පාලමෙන් එගොඩ, වංගුවෙන් එපිට නැවතුම් තැනින් බස්රියෙන් බැස ළඟම වූ කඩයකට ගොඩ වැදුණේය.

කඩය ඉදිරියේ කොත්තු රොටි, ආප්ප හැදෙන තැන වීදුරු තලුව තුලින් ඇහෙන්නේ රොටි කැපෙන 'ටක ටක' හඬයි. එතැන තල විදුලි එළිය ඇස් රිදවන තරම්ය. කඩය තුල ගුවන් විදුලියක ගීතයක් ඇසෙයි. වචන පැහැදිලි නැතත් එහි ශෝකී ස්වරයෙක් වෙයි. ගායිකාවකගේ කටහඬකි. දොරකඩ සිටගත් බිමල් වෙතට සේවකයෙක් පැමිණියේය.

දෙකට නමාගත් සරමක් හා සුදු බැනියමක් හැඳගත් තරුණ සේවකයා කඩිසරය.

"සර් - මොනවත් - කනවද?"

"රෑ කෑම?"

"බත් නම් තාම ලෑස්ති වෙනවා - සර්. ඉඳිආප්ප තියෙනවා - ආප්ප - කොත්තු රොටි - ."

බිමල්ට තවම නම් ඒ තරම් බඩගින්නක් නැත.

"තේ එකක් බොමු."

"සර් - ප්ලේන්ටී ?"

"එපා."

බිමල් ලැමිනේට් මතුපිට සහිත කුඩා මේසයක් වෙත හිඳ ගත්තේය. දෙතුන් දෙනෙක් ඉඳිආප්ප කති. තවත් අයෙක් තේ බොයි.

තමා ලෝකයේ තනිවූවෙක් වැන්න.

ලැම්බෙට් මේඝය තද දම් පැහැයකි. 'මූසල පාටක්'
බිමල්ට සිතුණි. 'අර මිනිහා, කීයට කතා කරාවිද? ජීවිතේ එක දවසක කොයි තරම් දෙයක් විය හැකිද? ඒ දවස තුළ තාත්තා කිනම් ජීවිතයක් ගත කරාවි, ඇද්ද? උදය සිරි කොහේ ගියාද? උදය සිරි ගැන යමක් සෝමෙ දන්නවා ඇති.. එහෙත්.. මේ බලා ඉඳීම තමා ඉවසන්න බැරි.

සැරින් පොද වැස්සක් ඇරඹුණි.

කොත්තු රොටි තැනීමේ වාදනය – ටක් ටක ටකය- නැවතිණි. ගුවන් විදුලියේ ගීතය අවසන් තවත් ගීතයක් ඇරඹෙනවිය. තේ කෝප්පය තවම නැත.

තම සෙලියුලර් දුරකථනය සමඟ අතැඟිල්ලෙන් සෙල්ලමක් කරමින් සිටි බිමල්ට අම්මා සිහිවූනිය. ඒත් අම්මාට කථා කරන්න ගියොත් සිතූ නැති ප්‍රශ්න වැලකට අහුවී. ඒ වෙනුවට බිමල් පද්මා අක්කාගේ දුරකථනයට යාවෙන නොම්බර එබුවේය. දුරකථනයට එහා පසින් පිළිතුරු දුන්නෙ පද්මා, නොව සුලෝචනාය.

"ආ..! බිමල් අයියා? කොහේද ඉන්නේ? මොනවද කරන්නෙ?" වෙන කිසිදාක නැති තරම් උනන්දුවක් සුලෝචනාගේ කටහඬේ විය– නොහොත් සිටීමෙන් හදවත උත්සුකමක් ඇතිවූ නාද?

"මං ඉන්නෙ කලුතර නංගී."

"බෝධි පූජාවක් තිබ්බද?"

"අක්කා ඉන්නවද?" පිළිතුරු නොදී බිමල් පැනයකට නැඟුවේය.

"අක්කා බිමල් අයියලා දිහා ගියා.. අයියා ඔයාලගෙ ගෙදරට කථා කළාද?"

"කලින් කතා කළා. අපේ අම්මට කරදරයක් නෑ-නෙ?"

"නෑ- නෑ. ඉතිං ඔයා අද එනවද?"

"නෑ සුලෝ-චනා. අද රෑ කෙනෙක් හම්බවෙන්න තියෙනවා- අපේ තාත්තා ගැන තොරතුරක් දැන ගන්න."

මඳ නිහැඬියාවක් විය.

"හරි- වැඩේ- නෙ?" සුලෝචනා, කීවාය. වෙන කියන්න දෙයක් නැතුව ඇති.

"නංගි සුලෝචනා- මේ ඔගොල්ල දන්න කවුද කලුතර ඉන්නවා කිව්ව නේද?"

"ඔව්."

"අන්න ඒකයි මට පද්මක්කාගෙන් අහන්න ඕනෑ."

"අයියෝ ඕකද? මං කියා දෙන්නං."

"කවුද ඉන්නෙ? කොහේද?"

"මං හරියටම තැන කියන්න දන්නෙ නැහැ - අපේ නෑදෑ කෙනෙක්."

"ඒ ටික මං දන්නවා."

"ඒ ටික තමයි මත් දන්නෙ.."

"අනේ සුලෝචනා - මේ..."

ඇගෙන් කිසි විස්තරයක් ලබා ගැනීම කොතරම් අසීරුද?

"ඇයි - බිමල් අයියා?"

"ඔය නෑදෑයන්ට නමක් තියෙනවද?"

"අපේ අක්කා කෙනෙක් - අපේ තාත්තගෙ අයියගෙ - ඒ කියන්නෙ - මහප්පගෙ එකම දුව - නිරංජලා."

"නිරංජලා?"

"ඔව් නිරංජලා අක්කා - එයාගෙ සැලෝන් එකක් තියෙනවා. මනාලියන්ට අඳිනවා - මේක් අප් දානවා - හෙයා ස්ටයිල් දානවා."

සුලෝචනා මෙතෙක් නොඇරි දොරක් ඇරියාක් මෙන් කියවාගෙන ගියාය.

"ඔන්න අපේ අක්කා එනවා." එක්වනම ඈ කීවාය. "ඉන්න."

පද්මා සමග කතා කිරීම බිමල්ට වඩාත් පහසු විය. සුජා කරදරයක් නැතිව ඉන්නවායි ඈ කීවාය.

කාන්තා ගැන තොරතුරක් සොයාගත්තත් නැතත් තම, පසුවදා ගෙදර එන බවය බිමල් කියා සිටියේ.

"මල්ලිට අද ඉන්න තැනක් තියෙනවද?" පද්මා, අක්කා, ඇසුවාය.

"ඔව් - යාලුවෙකුගෙ - ගෙදර."

"තැනක් ඕනෑනං කියන්න - අපේ නිරංජලා අක්කා ඉන්නවා. දකුණු කළුතර."

"හොඳයි දැන ගන්න එක හොඳයි. ඕනෑ කමක් දන්නං කියන්නංකො."

"සුජා අන්ටි බෙහෙත් බීලා නිදාගන්න ගියා. මං ආයෙ දැවෙලා,

ගිහින් බලන්නං. මල්ලි හිත් කරදර කරගන්න එපා."

"ආවම කතා කරමු." කී නිමල් දුරකතනය විසංධි කළේය.

උණු තේ කෝප්පය මේසය මත විය. එයින් දුමාලයක් නැගේ.

සෝමෙ කීයට කතා කරාවිද? ඈ දනයමා, රෑ පස්සෙ? මේසා එන්න කිව්වේ නමයෙන් පස්සෙ- කාම ගත වෙලත් නෑ. වෙලා යන ඉබි ගමන--- මේසා නමයෙන් පස්සෙ එන්න කිව්වෙ--- තේ උගුරක් බොන්නටත් කලින් නිමල්ගේ උදරය උණුසුම් විය. ඒ උණුසුම මුහුණටත්, කලවයටත් දැනුණි. නිමල් සෙමින් තේ බිව්වේය.

දුරකතනය නාද විය. නිමල් ඉස්සෙක මෙන් ගැස්සුණේ මේ සෝමෙ වෙන්නැති කියා සිතලාය. එහෙත් එහා පසින් කතා කළේ පද්මා අක්කාය.

" මල්ලි- "

" ඔව්. පද්මා අක්කෙ. "

"මෙන්න- අපේ නිරංජලා අක්කගෙ නොම්මරේ ලියාගන්න. මං දැන් කතා කළා. ඇඩ්‍රස් එකත් ලියාගන්න. ඔයාට අවශ්‍ය උනොත්."

" හිටංකෝ ඉන්න " කී නිමල් කාට මල්ලෙන් ගත් දින පොතේ පසු පිටක් පෙරළා පද්මා දුන් ලිපිනය හා නොම්බරය ලියා ගත්තේය.

"දකුණු කළුතර- ගාලු පාර අසල අයිනෙම මල්ලි. නිරංජලා හැලොන් කියල ගහලත් ඇති. නොම්මරේ තියෙනවනෙ දැන්- සොයාගන්න ලේසියි. මේ එයාට දැන් ඕනෑ නං කතා කරන්න. අද උනත් ගිහින් හම්බුවෙන්න. ඔයාට කැනක් නැත්නම එහේ උනත් ඉන්න පුළුවන්."

"නෑ - කරදර කරන්නෙ මොනවටද?"

"නෑ- නෑ කරදරයක් නෙවි. එයා තනියම ඉන්නෙ. එහේ වෙන කවුරුවත් නෑ. උදව්වට කවුද හැකි කෙනෙක් ඉන්නවා. එයා ඔයාට ඇ කෑම ටිකක් උනත් හදල දේවි."

"කරදර කරන්න බෑ අක්කෙ."

"කතා කරල බලන්නකෝ. ඔන්න මං තිබ්බා එහෙනං." කී පද්මා, දුරකතනය විසංධි කළාය.

නිමල්ගේ දුරකතනයේ මුහුණත වේලාව නවයට පහකි.

වෙලාව යන ඉබිගමන!

තවම රාත්‍රී ආහාරයකට වෙලාව නොවේ. තවමත් හතට කාලය ඉතිරිව තිබේ. මෙය අතරමැද අතරමං වූ වෙලාවකි. තේ බොන වෙලාවත් නොවේ. රෑ කෑම වෙලාවත් නොවේ. යන්නට තැනකුත් නැත. කරන්නට දෙයකුත් නැත.

ඔහු නිකමට පද්මා අක්කා දුන් දුරකථන නොම්බරයට කතා කළාය.

"හලෝ. ?"

"හලෝ - ඔව් ?"

"මං - බිමල් - පද්මා අක්කගෙ -"

"ඔව් බිමල් මල්ලි - පද්මා අක්කා කිව්වා - මල්ලි කොයි හරියෙද ඉන්නෙ ?"

"පාලම කිට්ටුව."

"වෙලාව තියෙනං ඇවිත් යන්න. තැන දන්නවද ?"

"දන්නවා - හොයා ගන්නං - නොම්බරේ තියෙනවා."

"ඇටෝල් ශෙඩ් එක ගාව හැරුම - වමේ පැත්තෙ -"

"මං එන්නං" කී බිමල් අසුනෙන් නැගුණේය.

තමා අද ඈත මූත යන්නේ ඔරලෝසුවක බට්ටෙක් මෙනැයි බිමල්ට සිතුණි. 'අද මොකක් හරි රාජකාරියක් ඇති' පාරට බසිද්දී ඔහු තමාටම කියා ගත්තේය.